# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. CSS/7/1/9/2018 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2018.01.30 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 03-2018

දකුණු පළාතේ සියලු ම

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත,

## අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - 2018

## රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අය කරනු ලබන ගාස්තු

උක්ත කරුණ සම්බන්ධව මහා භාණ්ඩාගාර ලේකම්ගේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2018 හා 2018.01.17 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. (අදාළ චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

02. රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා, දැනට අය කරනු ලබන ගාස්තු, පසුගිය වසර 03ක කාලයක් තුළ සංශෝධනය කර නොමැති නම්, එම ගාස්තු 15%කින් ඉහළ දැමීමට උක්ත චක්‍රලේඛය ප්‍රකාරව උපදෙස් ලබා දී ඇත.

03. ඒ අනුව, ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය විසින් ලබාදෙන සේවාවන් සඳහා, ගාස්තු අය කිරීමේ දී, එම සේවා සැපයීම සඳහා වන පරිපාලනමය වියදම් ආවරණය වන ආකාරයටත්, සේවාවන් ලබා ගන්නා මහජනයාට දැරීමට හැකි වන ආකාරයටත්, ඔබ ආයතන විසින් අය කරනු ලබන ගාස්තු 15%කින් සංශෝධනය කළ යුතුය.

04. එබැවින්, ඔබ ආයතනය විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා, දැනට අය කරනු ලබන ගාස්තු, පසුගිය වසර 03ක කාලයක් තුළ සංශෝධනය කර නොමැති නම්, එම ගාස්තු 15%කින් සංශෝධනය කර, මහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, 2018.02.15 දිනට ප්‍රථම යොමු කිරීමට ඒ පිළිබඳ විස්තරයක් **කඩිනමින්** මා වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk





ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

05. එසේම, පසුගිය වර්ෂ 03ක (2015/2016/2017) කාලය තුළ අවම වශයෙන් 15%කින් ගාස්තු සංශෝධනය කර ඇති ආයතන වේ නම්, මෙම චක්‍රලේඛයට උප ලේඛන 1 ලෙස අමුණා ඇති ආකෘතිය අනුව, පසුගිය වසර 03හි සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීම සඳහා, නොපමාව මා වෙත එවීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

06. තව ද, පසුගිය වර්ෂ 03ක කාලය තුළ 15%කට වඩා අඩු ප්‍රතිශතයකින් ගාස්තු සංශෝධනය කර ඇති ආයතන වේ නම්, එම ආයතන විසින් ද අදාළ ගාස්තු 15%ක උපරිමයක් තුළ වැඩි කෙරෙන පරිදි සංශෝධනය කර, මෙම චක්‍රලේඛයට උප ලේඛන 1 ලෙස අමුණා ඇති ආකෘතිය අනුව, පසුගිය වසර 03හි සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් නොපමාව මා වෙත එවීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

ආර්.සී ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:- 01. භාණ්ඩාගාර ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.ස.
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්), දකුණු පළාත - දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ (අයවැය / ගිණුම් හා ගෙවීම් / අභ්‍යන්තර විගණන), දකුණු පළාත - දැ.ගැ.ස.

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை | The Secretariat, Colombo 01, Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / தொலைநகல் - நிதி / Fax - Finance: (+94)-11-2449823

කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / தொலைநகல் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458

වෙබ් අඩවි / இணையத்தளங்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/Cir/01

ඔබේ අංකය / உமது இல. / Your No:

දිනය / திகதி / Date: 2018.01.17

24 JAN 2018

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 01/2018

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - 2018**
**රාජ්‍ය ආයතන විසින් සේවා සම්පාදනය සඳහා අයකරනු ලබන ගාස්තු**

අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අයකරනු ලබන ගාස්තු පසුගිය වසර 03 ක කාලයක් තුළ සංශෝධනය කර නොමැති නම් එම ගාස්තු 15%කින් ඉහළ දැමීමට 2017 වර්ෂයේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 2018 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාවන්හි 261 වන යෝජනාව අනුව තීරණය වී ඇත.

02. ඒ අනුව රාජ්‍ය ආයතන විසින් ලබාදෙන සේවාවන් සඳහා ගාස්තු අයකිරීමේදී එම සේවා සැපයීම සඳහා වන පරිපාලනමය වියදම් ආවරණය වන ආකාරයටත්, සේවාවන් ලබා ගන්නා මහජනයාට දැරීමට හැකිවන ආකාරයටත් ඔබ ආයතන විසින් අයකරනු ලබන ගාස්තු 15% කින් සංශෝධනය කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යොමු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2018.02.15 දිනට පෙර යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. පසුගිය වර්ෂ 03 ක (2015/2016/2017) කාලය තුළ අවම වශයෙන් 15%කින් ගාස්තු සංශෝධනය කර ඇති රාජ්‍ය ආයතන විසින් ඉහත 02 ඡේදය පරිදි කටයුතු කිරීම අවශ්‍ය නොවේ. එම ආයතන මෙම චක්‍රලේඛයට උපලේඛන I ලෙස අමුණා ඇති ආකෘතිය අනුව පසුගිය වසර 03හි සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් 2018.01.31 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු බව ද කාරුණිකව දන්වමි.

04. පසුගිය වර්ෂ 03ක කාලය තුළ 15%කට වඩා අඩු ප්‍රතිශතයකින් ගාස්තු සංශෝධනය කර ඇති ආයතන වේ නම් එම ආයතන විසින් ද අදාළ ගාස්තු 15% ක උපරිමයක් තුළ වැඩි කෙරෙන පරිදි සංශෝධනය කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යොමු කිරීම සඳහා ඉහත 02 ඡේදයේ සඳහන් ලෙස මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2017.02.15 දිනට පෙර යොමු කිරීමට කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි. එම ආයතන විසින් ද මෙම චක්‍රලේඛයට උපලේඛන I ලෙස අමුණා ඇති ආකෘතිය අනුව පසුගිය වසර 03හි සංශෝධනය කරන ලද ගාස්තු පිළිබඳව විස්තරයක් 2018.01.31 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

ආර්.එච්.එස්.සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති

ආකෘතිය 1

<u>ගාස්තු සංශෝධනය පිළිබඳ විස්තර - 2015/2016/2017</u>

ආයතනයේ නම:- ..........................................................

අමාත්‍යාංශය :- ..................................................................

| ගාස්තු සංශෝධනය කරන ලද වර්ෂය | සංශෝධනය කරන ලද ගාස්තු වර්ගය | සංශෝධනය කල ගාස්තුව | | 2015/2016/2017 වර්ෂවල එක් එක් ගාස්තුව යටතේ ලබා ගත් මුළු ආදායම (දළ වශයෙන්) රු. | එම ආදායම බැර කරන ලද ආදායම ශීර්ෂය |
|---|---|---|---|---|---|
| | | ප්‍රතිශතය | වටිනාකම<br>සිට දක්වා | | |
| | | | | | |